# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : RG/NB/01/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. : 565

ඔබේ අංකය / உமது இல. / Your No. :

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date : 2022.01.03


අභ්‍යන්තර චක්‍රලේඛ : 01/2022

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>බදු ඔප්පු සහ උකස්කර සඳහා මුද්දර ගාස්තු ගෙවීම</u>

1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ 22 වගන්තියට හා නොතාරිස් ආඥා පනතේ 31 (6), (7) වගන්තිවලට අනුව නොතාරිස්වරයෙකු විසින් ලියා සහතික කරනු ලබන ලේඛන සඳහා නියමිත මුද්දර ගාස්තු ගෙවිය යුතු වේ. මුද්දර ගාස්තුවට යටත් ලේඛනයක් සඳහා යථා පරිදි මුද්දර ගාස්තු ගෙවා නොමැති නම් එවැනි ලේඛනයක් ලියාපදිංචි කිරීම ඉඩම් රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් ප්‍රතික්ෂේප කළ යුතු බව ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 36(2) වගන්තියෙහි දක්වා ඇත.

02. ලේඛන සඳහා මුද්දර ගාස්තු ගෙවීම සම්බන්ධව නෛතික විධිවිධාන සලසා තිබුණ ද යම් යම් නොතාරිස්වරුන්, තමා විසින් ලියා සහතික කරනු ලබන ලේඛන සඳහා නිසි පරිදි දෙවන පිටපතට මුද්දර ගාස්තු නොගෙවන බවට මා වෙත වාර්තා වී ඇත. මෙය රජයට ලැබිය යුතු ආදායම් අහිමි කිරීමක් මෙන්ම මහජනතාව වෙත එම ලේඛනවල සහතික පිටපත් නිකුත් කිරීමේදී ද අප දෙපාර්තමේන්තුවට ගැටළුවක් වී ඇත.

03. මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා මීට පෙර අංක 03/2021 චක්‍රලේඛය මා විසින් නිකුත් කරන ලදී. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැරවන සේ නීත්‍යානුකූල ලේඛන සඳහා මුද්දර ගාස්තු ගෙවිය යුතු අවස්ථාවකදී දෙවන පිටපතට මුද්දර ගාස්තු ගෙවන ලද රිසිට්පතේ පිටපතක් හෝ අදාළ නොතාරිස්වරයා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද එම රිසිට් පතේ ඡායා පිටපතක් ලේඛනය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කිරීමේදී මුල් පිටපතට අමුණා භාර ගැනීමට කටයුතු කළ යුතු බව දන්වමි.

04. නියමිත මුද්දර ගාස්තු සඳහා දෙවන පිටපතට මුද්දර අලවා ඇති අවස්ථාවකදී, එකී දෙවන පිටපතෙහි පිටපතක් නොතාරිස්වරයා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කර එය මුල් පිටපත සමඟ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.




දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. : 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No : 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website : www.rgd.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail : rgd@sltnet.lk, rg@rgd.gov.lk

05. එම අවශ්‍යතා සම්පූර්ණ නොකරන ලේඛන සම්බන්ධයෙන් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 36 (2) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් : 01. අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් -
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක -
03. සියලුම කලාප භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් -
04. සියලුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් -
05. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් -

(01 - 05) කාරුණික දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා

06. ලේකම්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය - සාමාජිකත්වය දැනුවත් කිරීමට